**මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය - 2018**

**------------------------------------------------**

මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර, 2018 ඔක්තෝබර් 04 දින එළඹි අංක 6006 - එල් කේ දරණ මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය මුදල් අමාත්‍යාංශය මෙන්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව, විනිමය සුරැකුම් කොමිසම සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වේ. මූල්‍ය වෙළඳපොල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ පුද්ගලයන් අතර මූල්‍ය සේවා භාවිතය සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය, එක්සත් ජනපද ඩොලර් මිලියන 75 කට සමාන රුපියල් මිලියන 13,125 ක් වී තිබුණු අතර, ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැයම ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2018 ඔක්තෝබර් 18 දින ආරම්භ කර තිබුණු අතර, එය 2022 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට නියමිතව ඇත.

## 1.3 මතය

මාගේ මතය අනුව මේ සමඟ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනයන් තුළින්, 2018 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් පිළිඹිබු කෙරෙන අතර, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කර ඇත.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද :

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දූස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික කාර්යසාධනය

ප්‍රතිඵල පාදක මූල්‍යකරණය තුළින් තෝරාගත් මධ්‍ය මට්ටමේ ප්‍රතිසංස්කරණ සඳහා සහායවීම, නියාමකයින්ගේ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම, භෞතික හා නියාමන රාමුව වැඩිදියුණු කිරීම හා මූල්‍ය වෙළඳපොළ යටිතල පහසුකම් නවීකරණය යනාදී සංරචක 04 ක් යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ. ණය මුදල ක්‍රියාත්මක වීම 2018 පෙබරවාරි 22 දිනට නියමිතව තිබුණද ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය ස්ථාපිත කර තිබුණේ වසරක් ප්‍රමාදවී 2018 ඔක්තෝබර් මාසයේදීය. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍යකරණ ගිවිසුමේ උපලේඛන 2 හි දක්වා ඇති පරිදි මාස 02 ක් තුළදී සම්පූර්ණ කළයුතු ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව හා මධ්‍යම ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය ස්ථාපිත කිරීම සහ මෙහෙයුම් අත්පොත් පිළියෙළ කිරීම යනාදී කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර නොතිබුණි. ලැබුණු තොරතුරු වලට අනුව, ප්‍රතිඵල පාදක මූල්‍යකරණය තුළින් තෝරාගත් මධ්‍ය මට්ටමේ ප්‍රතිසංස්කරණය සඳහා සහායවීම සංරචකය යටතේ 2018 දෙසැම්බර් 31 දිනට ළඟාකර ගතයුතුව තිබුණු උපයෝජනය සබැඳි ප්‍රතිඵල 10 ක් අතුරින් උපයෝජනය සබැඳි ප්‍රතිඵල 02 ක් පමණක් ලගාකරගෙන තිබුණි.